වලෙන්තීන් කතායෙව්

# හත් පෙති මල
## සහ
# තවත් කතා









# සම්භාව්‍ය සෝවියට් ළමා කතා



වලෙන්තීන් කතායෙව්

# හත්පෙති මල

සහ

# තවත් කතා







චිත්‍ර - නතාලියා දෙමීදවා

අනුවාදය - තාරක ලියනාඩෝ විපුලගුණ
(රුසියානු මුල් පිටපතෙනි)

වලෙන්තීන් කතායෙව්

# හත්පෙති මල

## සහ

# තවත් කතා

ISBN 978-624-6327-15-6

චිත්‍ර
නතාලියා දෙමීදවා

අනුවාදය
තාරක ලියනාඩෝ විපුලගුණ

Published by

පොතක්.LK

facebook.com/pothaksl.lk
072 636 6000

**www.pothak.lk**

Powered by **Sinavi Mart**
Ganemulla Road, Kadawatha.

August - 2024

# පටුන



හත්පෙති මල
7

නළාව සහ ජෝගුව
43

ලී කොටය
63

බිම්මල්
67

මුතුඇටය
73



# හත්පෙති මල




ПОЧТА




ශේන්යා කියල පුංචි ගැහැනු ළමයෙක් හිටියා. දවසක් එයාගේ අම්මා එයාව පාන් වළලු ගේන්න කඩේට පිටත් කළා. ශේන්යා ගත්තා පාන් වළලු හතක්. සුවඳ කවාපු දෙකක් තාත්තාට, පොපි ඇට දාපු දෙකක් අම්මාට, සීනි දාපු දෙකක් තමාට, රෝස පාට පුංචි පාන් වළල්ලක් පාව්ලික් මල්ලිට. ඔන්න ඇය පාන් වළලු ටිකත් එල්ලාගෙන ගෙදර යනවා. පාර දිගේ ඇවිදගෙන යන අතරෙදී ඇය වටපිට බලනවා, දෙපැත්තේ තියෙන නාම පුවරු කියවනවා, කපුටන් ගණිනවා.

මේ අතරතුරේදී නන්නාඳුනන බල්ලෙක් ඇය පසු පසින් එන්න පටන් ගත්තා. ඌ පාන් වළලු එකින් එක කනවා. මුලින්ම සුවඳ කවාපු තාත්තගේ පාන් වළලු දෙක. ඉන් පසුව අම්මාගේ පොපි ඇට දාපුවා. ඊටත් පසුව සීනි දාපු ශේන්යාගේ ඒවා. ශේන්යාගේ අතට සැහැල්ලුවක් දැනෙන්න පටන් ගත්තා. ඇය ආපසු හැරිලා බැලුවා. ඒත් පරක්කු වැඩියි. බල්ලා පාව්ලික් මල්ලිගේ රෝසපාට පාන් වළල්ලත් කනවා.



"නරක බල්ලා!" ශේන්යා කෑගසමින් බල්ලාව අල්ලන්න දිව්වා. ඇය දිව්වා, දිව්වා, ඒත් ඇයට ඌව අල්ලගන්න බැරිවුණා. ඇය අතරමං වුණා. ඇය ඉන්නේ හුරු පුරුදු පැත්තක නෙවෙයි. ලොකු ගෙවල් නැහැ. පුංචි ගෙවල් තියෙන්නේ. ශේන්යා බයවුණා. ඇය අඬන්න පටන් ගත්තා. එක පාරටම අත්තම්මා කෙනෙක් ඇයට කතා කළා.



"ගැහැනු ළමයෝ! ගැහැනු ළමයෝ! ඇයි ඔයා අඬන්නෙ."

"ශේන්යා අත්තම්මාට හැමදේම කිව්වා."

අත්තම්මාට ශේන්යා ගැන දුක හිතිලා ඇයව මල් වත්තකට එක්ක ගිහින් මෙහෙම කිව්වා.

"දැන් ඉතින් අඬන්න එපා. මම ඔයාට උදව් කරන්නම්. ඇත්ත, මා ළඟ පාන් වළලු, සල්ලි ඔය මොනවත් නැහැ තමයි. එත් මගේ වත්තේ එක මලක් තියෙනවා. ඒකට කියන්නේ හත්පෙති මල කියලා. ඒ මලට ඕනැම දෙයක් කරන්න පුළුවන්. පාරේ යද්දී වට පිට බල බලා නොසැලකිල්ලෙන් ගියත්, ඔයා හොඳ ළමයෙක් බව මම දන්නවා. ඉතින් මම ඒ හත්පෙති මල ඔයාට තෑගි කරන්නම්. ඒ මල හැමදේම කරල දේවි." මෙහෙම කියන ගමන් ඒ අත්තම්මා මල් වත්තෙන් ඩේසි මලක් වගේ මලක් කඩල අරන් ශේන්යාට දුන්නා.

ඒ මලේ විනිවිද පෙනෙන පෙති හතක් තිබුණා. එක් එක් පෙතිවල පාට වෙනස්.

කහ, රතු, කොළ, තද නිල්, තැඹිලි, දම් සහ ලා නිල් පාට.

"මේ මල නිකන්ම මලක් නෙවෙයි." අත්තම්මා කිව්වා. "එයට පුළුවන් ඔයාට ඕනම දෙයක් කරලා දෙන්න. ඔයාට කරන්න තියෙන්නෙ මෙච්චරයි. මේ මලෙන් පෙත්තක් කඩල අරන් විසි කරල මෙහෙම කියන්න."

"මල් පෙත්තේ, මල් පෙත්තේ
උතුරු දෙසට දකුණු දෙසට
බටහිරටත් නැගෙනහිරට
ඉගිළ ඉගිළ මෙහැම දෙසට
කැරකීලා ඇවිත් බිමට
මා කියන දෙය කර දෙන් මට"


ඉතින් මෙහෙම කියලා ඔයාට වෙන්න ඕන දේ කියන්න. එතකොට, ඒක ඒ දේ කරලා දෙනවා.



ශේන්යා විනීත විදිහට අත්තම්මාට ස්තුති කරල මල් වත්තෙන් පිටවුණාටත් පසුව තමයි ඇයට මතක් වුණේ ගෙදර යන්න පාර නොදන්නා බව. ඇයට ඕන වුණා නැවත මල් වත්තට ගිහින් අත්තම්මා එක්ක ළඟම සිටින පොලිස් භටයා ළඟට යන්න.

ඒත් අත්තම්මාවත්, මල් වත්තවත් කලින් තිබුණු තැන පේන්න නැහැ. මොනවා කරන්නද? ශේන්යා පුරුදු විදිහට අඬන්න පටන්ගත්තා. ඇයගේ නහය පරඬැලක් වගේ ඇකිළිලා. ඒත් ඇයට එක් වරම අත්තම්මා දීපු හත්පෙති මල ගැන මතක් වුණා.





"හොඳයි බලමුකෝ එහෙනම් මේ හත්පෙති මල මොනවගේ මලක්ද කියල."

ශේන්යා මලේ කහපාට පෙත්ත හණික කඩලා අරන් ඈතට විසි කරල මෙහෙම කිව්වා.

"මල් පෙත්තේ, මල් පෙත්තේ
උතුරු දෙසට දකුණු දෙසට
බටහිරටත් නැගෙනහිරට
ඉගිළ ඉගිළ මෙහැම දෙසට
කැරකීලා ඇවිත් බිමට
මා කියන දෙය කර දෙන් මට"

**පාන් වළලු එක්ක මා ගෙදර ඉන්න ඕන.**



ඒක කියල ඉවර කර ගන්න ලැබුණේ නැහැ. ඇය පාන් වළලුත් අතේ තියාගෙන ගෙදරටම ඇවිත්.

පාන් වළලු ටික අම්මට දීපු ශේන්යා මෙහෙම හිතන්න පටන් ගත්තා. ඇත්තටම මේක හරිම පුදුම මලක් තමයි. මේක ලස්සනම මල් පෝච්චියේ තියන්න ඕන.

ශේන්යා බොහොම පුංචි ගැහැනු ළමයෙක් නිසා, රාක්කයේ උඩම තිබුණු අම්මාගේ ප්‍රියතම මල් පෝච්චිය ගන්න පුටුවක් තියල උඩට නගින්න ඇයට ඕනවුණා.

ඒ වෙලාවෙම කරුමෙකට වගේ කාක්කෝ රංචුවක් ජනේලය පහුකරගෙන පියාඹාගෙන ගියා. ශේන්යාට ඕනවුණා එතන හරියටම කාක්කෝ කී දෙනෙක් ඉන්නවද කියල දැන ගන්න. හත් දෙනෙක්ද? අට දෙනෙක්ද? ඇය කට ඇරගෙන ගණන් කරන්න පටන් ගත්තා, ඇඟිලි නවමින්. "දඩාස් !" මල් පෝච්චිය බිමට වැටිල පොඩි පොඩි කෑලිවලට කුඩු වුණා.

"ආයෙත් මොනවහරි බින්ද නේද? මෝඩ ළමයා. අම්මා කුස්සියේ ඉඳන් කෑගැහුවා. "මගේ ලස්සන මල් පෝච්චිය නේද බින්දෙ ?"



"නෑ! නෑ! අම්මා. මම මොනවත් බින්දෙ නැහැ." ශේන්යා කෑගැහුවා. ඇය ඉක්මනට ඉක්මනට හත් පෙති මලේ රතුපාට පෙත්ත කඩල අරන් විසි කරල සිහින් හඬින් මෙහෙම කිව්වා.

"මල් පෙත්තේ, මල් පෙත්තේ
උතුරු දෙසට දකුණු දෙසට
බටහිරටත් නැගෙනහිරට
ඉගිළ ඉගිළ මෙහැම දෙසට
කැරකීලා ඇවිත් බිමට
මා කියන දෙය කර දෙන් මට"

**අම්මාගේ මල් පෝච්චිය තිබුණු විදිහටම හැදෙන්න ඕන.**





ඇය මෙහෙම කියල ඉවර වෙන්නත් කලින් කැඩුණු කෑලි ටික එකට ළංවෙලා ආපහු මල් පෝච්චිය හැදෙන්න පටන් ගත්තා.

අම්මා කුස්සියේ ඉඳල දුවගෙන ආවා. ඇයගේ ප්‍රියතම මල් පෝච්චිය ඒ විදිහටම තියනවා. එතන කිසිම දෙයක් සිද්ධ වුණු පාටකුත් පේන්න නැහැ. කොහොම වුණත් අම්මා ශේන්යා දිහාට ඇඟිල්ල දික්කරලා මිදුලට යන්න කියල තරවටු කළා.



ශේන්යා මිදුලට එද්දී එතන පිරිමි ළමයි සෙල්ලමක් කරනවා.

ඔවුන් පරණ ලෑලි ගොඩක් උඩ හිඳගෙන ඉන්නවා. වැල්ලේ කෝටුවක් සිටුවල තියෙනවා.

"ළමයිනේ ! ළමයිනේ! මාවත් සෙල්ලමට ගන්න."

"බලන්නකෝ මෙයාට ඕන වෙලා තියෙන දේ. ඔයාට පේන්නෙ නැත්ද මේ උතුරු කෙළවරේ සෙල්ලම. අපි ගෑනු ළමයිව උතුරු කෙළවරට ගන්නෙ නැහැ."

"මොන උතුරු කෙළවරක්ද? ලෑලි ගොඩක් විතරයි."

"මේ ලෑලි නෙවෙයි. අයිස් කුට්ටි.. එහාට යන්න කරදර කරන්න එපා."

"හා ! එහෙනම් මාව ගන්නෙ නෑ. එහෙමද?"

"ඔව්! ගන්නෙ නෑ. යන්න මෙතනින්.'

"කොහොමත් මට ඕන නෑ. මම යනවා තනියම උතුරු කෙළවරට. මේ වගේ බොරු උතුරු කෙළවරට නෙවෙයි, ඇත්තම උතුරු කෙළවරට"

ශේන්යා එහාට ඇවිදගෙන ගිහින් හත්පෙති මල අතට අරගෙන තද නිල්පාට පෙත්ත කඩල විසි කරල මෙහෙම කිව්වා.

"මල් පෙත්තේ, මල් පෙත්තේ
උතුරු දෙසට දකුණු දෙසට
බටහිරටත් නැගෙනහිරට
ඉගිළ ඉගිළ මෙහැම දෙසට
කැරකීලා ඇවිත් බිමට
මා කියන දෙය කර දෙන් මට"

**මාව මේ දැන් උතුරු කෙළවරට ගෙනියන්න ඕන.**



ඇය එහෙම කියල ඉවර වෙන්න වුණේ නෑ කොහේදෝ ඉඳල සුළිසුළඟක් හමාගෙන ආව. ඉර නොපෙනී ගියා. භයානක රාත්‍රියක් උදාවුණා. ඇයගේ දෙපාවලට යටින් ඇති පොළොව බඹරයක් වගේ කැරකෙන්න පටන් ගත්තා.

ශේන්යා ඇඳගෙන හිටියේ ගිම්හාන ඇඳුමක්. ඇයට උතුරු කෙළවරේ ලොකු පාළුවක් දැනුණා. අංශක සෘණ සීයටත් පහළ උෂ්ණත්වයක්!

"අයියෝ! අම්මා මාව වෙව්ලනවා." ශේන්යා කෑගසමින් අඬන්න පටන් ගත්තා.



ඒත් ඒ කඳුළු පවා බොහොම ඉක්මනින් මිදිලා අයිස් බවට පත්වෙලා, ඇයගේ නාසයෙන් පහළට එල්ලුණා. හරියට වහලයකින් බිමට එල්ලෙන වතුර බටයක් වගේ.

මේ අතරතුර අයිස් කඳු අතර ඉඳලා හිම වලසුන් හත්දෙනෙක් ශේන්යා දිහාට එන්න පටන් ගත්තා. එකෙක් අනිකාට වඩා භයානකයි; පළමුවැන්නා කලබලකාරියි; දෙවැන්නාට තරහ ගිහින්; තුන්වැන්නා තොප්පියක් දාල; හතරවැනියාගේ ලොම් හරිම දිගයි; පස්වැනියාගේ ලෝම කැරලි ගැහිලා; හයවැන්නාගේ මුහුණ පුරා බිබිළි; හත්වැන්නා මහා විශාලයි.

හොඳටම බයවුණ ශේන්යා ඉක්මනින් හත්පෙති මල අතට අරගෙන වෙව්ලන ඇඟිලිවලින් කොළපාට පෙත්ත කඩල වීසි කරල ඇයට පුළුවන්තරම් හයියෙන් කෑගහල මෙහෙම කිව්වා.





"මල් පෙත්තේ, මල් පෙත්තේ
උතුරු දෙසට දකුණු දෙසට
බටහිරටත් නැගෙනහිරට
ඉගිළ ඉගිළ මෙහැම දෙසට
කැරකීලා ඇවිත් බිමට
මා කියන දෙය කර දෙන් මට"

මාව මේ මොහොතෙම අපේ ගෙදර මිදුලට ගෙනියන්න.



එහෙම කියනවත් එක්කම ඇය ඇගේ ගෙදර මිදුලේ ඉන්නවා ඇයට දකින්නට පුළුවන් වුණා; පිරිමි ළමයි ඇය දිහා බලල ඇයට හිනාවුණා.

"කෝ, කෝ, ඔයාගෙ උතුරු කෙළවර?"

"මම එහාට ගියා."

"අපි දැක්කෙ නෑ. ඔප්පු කරන්න."

"පේන්නෙ නැත්ද? තාම මගේ නාහෙ එල්ලෙන අයිස්."

"ඒ අයිස් නෙවෙයි."

ශේන්යාට හොඳටම තරහ ගිහින් පිරිමි ළමයි ඉන්න තැනින් යන්න තීරණය කළා. එයා ගියා තවත් මිදුලකට ගැහැනු ළමයි ඉන්න. ශේන්යා දැක්කා ඒ ගැහැනු ළමයින්ට එක එක විදිහේ සෙල්ලම් බඩු තියෙනවා.

එක්කෙනෙකුට තිබුණා රෝද තුනේ කරත්තයක්; තවත් කෙනෙක් ළඟ බෝලයක්; තවත් ගැහැනු ළමයෙක් ළඟ ස්කිපින් ලණුවක්; තවත් කෙනෙක් ළඟ තිබුණා කතා කරන බෝනික්කෙක්, ශේන්යාට දුක හිතුණා.ශේන්යාට තරහ ගියා. ඇයගේ ඇස් ඊර්ෂ්‍යාවෙන් කොළපාට වුණා.

"හොඳයි බලමුකෝ. මම පෙන්නන්නම්කො කා ළඟද සෙල්ලම් බඩු තියෙන්නෙ කියල."



ඇය හත්පෙති මල අතට අරගෙන තැඹිලි පාට පෙත්ත කඩල අරන් විසි කරල මෙහෙම කිව්වා.

"මල් පෙත්තේ, මල් පෙත්තේ
උතුරු දෙසට දකුණු දෙසට
බටහිරටත් නැගෙනහිරට
ඉගිළ ඉගිළ මෙහැම දෙසට
කැරකීලා ඇවිත් බිමට
මා කියන දෙය කර දෙන් මට"

**මේ ලෝකේ තියෙන සේරම සෙල්ලම් බඩු මට ලැබෙන්න ඕන.**

ඒ මොහොතෙම කොහෙන් එනවද කියල හිතාගන්න බැරි විදිහට හැම පැත්තෙන්ම සෙල්ලම් බඩු ඇය දිහාට ගලාගෙන එන්න පටන් ගත්තා.

මුලින්ම ආවේ බෝනික්කෝ. වේගයෙන් ඇහිපිය ගසමින් "අම්මා, තාත්තා, අම්මා, තාත්තා" කියමින්. මුලදී ශේන්යාට හරිම සතුටුයි. ඒත් බොහොම ඉක්මනින්ම මුළු මිදුලත්, ඉන් පසුව පටුමඟත් වීදි වගේම මුළු චතුරස්‍රයත් බෝනික්කන්ගෙන් පිරුණා.

බෝනික්කෙක් නොපෑගී කිසිම තැනකට අඩිය තියන්න බැහැ. මිලියන පහක් බෝනික්කන් එකවර කතා කරද්දී ඇතිවන ශබ්දය හිතාගන්න පුළුවන් නොවැ. ඒ මොස්කව් නගරයේ බෝනික්කන් විතරයි. ලෙනින්ග්‍රාද් හා කොව්, කියෙව්, ලිවොව් වගේ අනෙක් සෝවියට් නගරවල බෝනික්කන් තවම ඇවිත් නැහැ. ශේන්යාට දැන් නම් ටිකක් බය හිතුණා. ඒත් තවම පටන්ගත්තා විතරයි.







ලොකු බෝල, පුංචි බෝල, ස්කූටර, රෝද තුනේ පාපැදි, ට්‍රැක්ටර්, මෝටර් රථ, යුද්ධ ටැංකි, සන්නද්ධ රථ, කාලතුවක්කු, බෝනික්කන්ට පිටුපසින් පෙරළෙමින් ආවා. ස්කිපින් ලණු සර්පයන් වගේ බිම දිගේ බඩගානවා. ඒවා බෝනික්කන්ගේ කකුල්වල පැටලුණා. මෙයින් කලබල වුණු බෝනික්කෝ තවත් හයියෙන් කෑ ගහන්න පටන් ගත්තා. මිලියන ගණන් සෙල්ලම් අහස් යානා, ග්ලයිඩර් යානා අහසේ පාවෙන්න පටන් ගත්තා. පැරෂුට් අහසින් පහළට වැටුණේ ටියුලිප් මල් වගේ. සමහර ඒවා දුරකථන කම්බිවල සහ ගස්වල පවා රැඳුණා.





මුළු නගරයේම වාහන ගමනාගමනය නැවතුණා. පොලිස් භටයෝ කරකියා ගත හැකි දෙයක් නැතිව පහන් කණුවලට නැග්ගා.

"ඇති! ඇති!" හොඳටම බයවුණු ශේන්යා කෑගැහුවා.

"හොඳයි. හොඳයි, ඔයාල කව්ද?

මට මේ තරම් සෙල්ලම් බඩු ඕන නෑ. මම විහිළුවක් කළේ."

ඒත් පලක් වුණේ නෑ. දිගටම සෙල්ලම් බඩු ගලාගෙන එනවා.. එනවා..

ශේන්යා පඩි පෙළට නැග්ගා. සෙල්ලම් බඩු ඈ පස්සෙන්. ශේන්යා සොල්දරයට නැග්ගා. සෙල්ලම් බඩු ඈ පස්සෙන්. බැරිම තැන ශේන්යා වහලට නැගලා පුළුවන් තරම් ඉක්මනින් මලේ දම් පාට පෙත්ත කඩල විසි කරල මෙහෙම කිව්වා.

"මල් පෙත්තේ, මල් පෙත්තේ
උතුරු දෙසට දකුණු දෙසට
බටහිරටත් නැගෙනහිරට
ඉගිළ ඉගිළ මෙහැම දෙසට
කැරකීලා ඇවිත් බිමට
මා කියන දෙය කර දෙන් මට"

**පුළුවන් තරම් ඉක්මනින් සෙල්ලම්බඩු සේරම ආපහු සාප්පුවලට යන්න ඕන.**





එතකොටම සේරම සෙල්ලම්බඩු අතුරුදහන් වුණා. ශේන්යා හත්පෙති මල දිහා බැලුවම දැක්කා ඉතිරිවෙලා තියෙන්නේ එකම එක පෙත්තක් බව.


"අපරාදේ ! පෙති හයක්ම කිසිම තේරුමක් නැතිව නිකන්ම නාස්ති වෙලා ගියා. කමක් නෑ. ඉස්සරහට කල්පනාවෙන් වැඩ කරනවා."


ශේන්යා වීදිය දිගේ ඇවිදගෙන ගියා කල්පනා කරමින්.






මොනවද ඉල්ලන්නෙ. ඉඟුරු විස්කෝතු කිලෝ දෙකක් ඉල්ලනවා, නෑ, දෝසි කිලෝ දෙකක් වඩා හොඳයි. ඊට වඩා හොඳයි ඉඟුරු විස්කෝතු කිලෝ එකකුයි දෝසි කිලෝ එකකුයි තව හල්වා ග්‍රෑම් සීයක් එක්ක කජු ඇට ග්‍රෑම් සීයක් පාවිලික් මල්ලිට රෝසපාට පාන් වළල්ලකුත් එක්ක. මොකක්ද ඇති වැඩේ?








ඉල්ලුව කියමු. ඉල්ලල සේරම කනවා. මොනවත් ඉතුරු වෙන්නේ නෑ.

නෑ... රෝද තුනේ සයිකලයක් වඩා හොඳයි. ඒක මට පදින්න පුළුවන්. එත් අන්තිමේ පිරිමි ළමයි ඒක උදුරා ගනීවි. නැතිනම් රණ්ඩුවට ඒවි.

ඕන නෑ. ඉල්ලනවා සර්කස් එකක් හරි චිත්‍රපටියක් හරි බලන්න ටිකට් එකක්. බලල විනෝද වෙන්න පුළුවන්.



අලුත් සපත්තු දෙකක් ඉල්ලන එක වඩා හොඳයි. ඒක සර්කස් එක තරම් නරක නෑ. ඒත් ඉතින් අලුත් සපත්තු මොකටද? ඊටත් වඩා හොඳ දෙයක් ඉල්ලන්න ඕන. වැදගත්ම දේ තමයි කලබල නොවීම.

මෙහෙම කල්පනා කරමින් යන අතරේ ශේන්යා දැක්කා ප්‍රසන්න පිරිමි ළමයෙක් උද්‍යානයේ බංකුවක් උඩ වාඩිවෙලා ඉන්නවා. ඔහුට තිබුණා ලොකු නිල්පාට ඇස්; දීප්තිමත් ඒත් බයාදු. පිරිමි ළමයා හරිම කඩවසම්. ශේන්යාට තේරුම් ගියා ඔහු රණ්ඩු කරන ජාතියේ කෙනෙක් නොවන බව. ශේන්යාට ඕනවුණා ඔහු සමඟ යාළු වෙන්න.

ඉතින් ශේන්යා ඔහු දිහාට කිට්ටු වුණා. එවිට ඇය දැක්කා ඔහුගේ ඇස්වල කළු ඉංගිරියාවල කොණ්ඩ කරල් දෙකක් ගොතාගෙන සිටින තමන්ගේ මුහුණේ ඡායාව.

"ළමයෝ, ළමයෝ, ඔයාගෙ නම මොකක්ද?"

"වීත්යා, ඔයාගේ නම මොකක්ද?"

"ශේන්යා, අපි සෙල්ලම් කරමු."

"බැහැ" මම කොරයි.

එවිට තමයි ශේන්යා දැක්කේ ඔහුගේ කකුලේ දාල තිබෙන ලොකු අඩියක් ඇති අවලස්සන සපත්තුව.

"අයියෝ" ශේන්යා කිව්වා.

"මම ඔයාට හරිම කැමතියි. මම ආසයි ඔයා එක්ක දුවන්න."

"මාත් ඒකට හරිම කැමතියි. මමත් හරිම අසාවෙන් එනව ඔයත් එක්ක දුවන්න. ඒත් මොනවා කරන්නද? ඒක කරන්න බෑ. මගේ මුළු ජීවිත කාලයම මෙහෙම තමයි."

"විකාර කියන්න එපා ළමයෝ." එහෙම කියපු ශේන්යා එයාගේ සාක්කුවෙන් හත් පෙති මල එළියට ගත්තා.



පරිස්සමින් අවසාන නිල්පාට පෙත්ත කඩල අතට ගත්ත ඇය, ඇසට තියල තද කරගෙන ඉඳලා ඇඟිලිවලින් මල්පෙත්ත නිදහස් කරමින් සතුටින් ගැහෙන හඬකින් මෙහෙම ගයන්න පටන් ගත්තා.







“මල් පෙත්තේ, මල් පෙත්තේ
උතුරු දෙසට දකුණු දෙසට
බටහිරටත් නැගෙනහිරට
ඉගිළ ඉගිළ මෙහැම දෙසට
කැරකීලා ඇවිත් බිමට
මා කියන දෙය කර දෙන් මට”

**වීත්යාට සනීපවෙන්න ඕන.**


එහෙම කියන කොටම විත්යා බංකුවෙන් නැඟිටලා ශේන්යා එක්ක සෙල්ලම් කරන්න පටන්ගත්තා. වීත්යා කොතරම් වේගයෙන් දිව්වද කියනවනම් ශේන්යාට ඔහුගේ කිට්ටුවටවත් එන්න බැරිවුණා. ඈය මොනතරම් උත්සාහ කළා වුණත්.



# නළාව සහ ජෝගුව







ඔන්න කැලෑවේ ස්ට්‍රෝබෙරි පැහෙන කාලය ඇවිදින්.

තාත්තා ලොකු කෝප්පයක් ගත්තා. අම්මා කුඩා කෝප්පයක් ගත්තා. ශේන්යා ජෝගුවක් ගත්තා. පාව්ලික් මල්ලිට පීරිසියක් ලැබුණා.

හැමෝම කැලෑවට ඇවිත් ස්ට්‍රෝබෙරි කඩන්න පටන් ගත්තා. කාටද ඉක්මනින්ම කඩල ඉවර කරන්න පුළුවන්?

අම්මා අත දිගු කරල ශේන්යාට මෙහෙම කිව්වා.

"මෙන්න ඔයාට ගැළපෙන හොඳ තැනක් තියෙනවා දුව. මෙතන ස්ට්‍රෝබෙරි හුඟක් තියෙනවා. ගිහින් එකතු කරන්න."

ඉතින් නිදිකුම්බා මල් පොකුරක් අහුලාගෙන ජෝගුව පිහිදාපු ශේන්යා ඒ දිහාට ඇවිදගෙන ගියා.

ඇය ඇවිදගෙන ගිහින් බැලුවා... බැලුවා... ඒත් මොනවත්ම හොයාගන්න ලැබුණෙ නැහැ.

ඇය හිස් ජෝගුවත් අරගෙන ආපහු ආවා.

ආපහු ආපු ශේන්යා දැක්කා හැමකෙනාගෙම ළඟ ස්ට්‍රෝබෙරි තියෙන හැටි.

තාත්තගේ ලොකු කොප්පයෙන් කාලක් පිරිලා තිබුණා. අම්මගේ පොඩි කෝප්පයෙන් බාගයක් පිරිල තිබුණා. පාවිලික් මල්ලිගේ පීරිසියේත් ස්ට්‍රෝබෙරි ගෙඩි දෙකක් තිබුණා.

"අම්මා ඇයි ඔයාල හැමෝටම තියෙද්දී මට එකක්වත් නැත්තෙ. ඔයා මට තෝරල දෙන්න ඇත්තෙ නරකම පැත්තක්."

"ඔයා හොඳට බැලුවද?"

"ඔව් හොඳට බැලුව. ඒත් එක ගෙඩියක්වත් නැහැ. කොළ විතරයි."



"කොළවල යට් පැත්තෙ බැලුවද?"

"මම බැලුවෙ නැහැ."

"පේනවා නේද? මෙහෙම පහත්වෙලා වාඩි වෙන්න ඕන."

"ඇයි පාව්ලික් මල්ලි එහෙම වාඩි නොවෙන්නෙ?"

"පාව්ලික් මල්ලි පුංචියි. එයාගෙ උස ස්ට්‍රෝබෙරි ගහක් තරම. ඒ නිසා එයාට එහෙම කරන්න ඕන වෙන්නෙ නැහැ. ඔයා දැනටමත් උස ගැහැනු ළමයෙක්නෙ."





ඊට පසුව තාත්තා මෙහෙම කිව්වා.

"ස්ට්‍රෝබෙරි ගෙඩි කපටියි. ඒවා හැමතිස්සෙම හැංගෙනවා. ඔයාට පුළුවන් වෙන්න ඕන ඒවා සොයා ගන්න." මෙහෙම කියපු තාත්තා පහත්වෙලා ඉඳගෙන බිම දිහාට නැවිලා කොළ යට බලන ගමන් මෙහෙම කිව්වා.

එක ගෙඩියක් මම කඩනව - තවත් එකක් ගැන බලමින්
තුන්වෙනියත් මට පෙනෙනව - හතරවෙනිය එබී බලයි.

"හොඳයි ! ශේන්යා කිව්වා. ස්තූතියි තාත්තා ! මම ඒ විදියට කරන්නම්." ශේන්යා ආපහු ඇයගේ බිම්කඩට ගියා. ඇන තියාගෙන බිමට නැවිලා කොළවල යටිපැත්ත දිහා බැලුවා. මුලින් ඇයට ස්ට්‍රෝබෙරි ගෙඩි දකින්න ලැබුණේ නැහැ. ඇය තවත් හොඳින් බැලුවා.

එක ගෙඩියක් මම කඩනව - තවත් එකක් ගැන බලමින්
තුන්වෙනියත් මට පෙනෙනව - හතරවෙනිය එබී බලයි.

කියමින් ශේන්යා ස්ට්‍රෝබෙරි කඩන්න පටන්ගත්තා. ඒවා ජෝගුවට දමා ගත්තා. කොහොම නමුත්, ඇන තියාගෙන හිටි නිසා ශේන්යාට වෙහෙස දැනෙන්න පටන් ගත්තා, බොහොම ඉක්මනටම.

දැන් හොඳටම ඇති. ඇයට සිතුණා. මම දැනටමත් හුඟක් එකතු කරගෙන තියෙනවා. ශේන්යා හිටගෙන ජෝගුවේ ඇතුළ බැලුව. ස්ට්‍රෝබෙරි ගෙඩි හතරක් විතරයි තිබුණේ. "චුට්ටයි" දැන් ඉතින් ආපහු වාඩි වෙන්න වෙනවා.

ශේන්යා ආපහු ඇන තියාගෙන ස්ට්‍රෝබෙරි කඩන්න පටන් ගත්තා.

එක ගෙඩියක් මම කඩනව - තවත් එකක් ගැන බලමින්
තුන්වෙනියත් මට පෙනෙනව - හතරවෙනිය එබී බලයි.

ශේන්යා ජෝගුව ඇතුළ බැලුවා. තාමත් තියෙන්නේ ගෙඩි අටක් විතරයි. ජෝගුවේ පතුලවත් වැහිලා නැහැ.


හොඳයි බලමුකෝ.. ශේන්යා කල්පනා කළා. මම මේවා එකතු කරන්න කොහෙත්ම කැමති නැහැ. හැමවෙලේම නැවෙනවා, නැවෙනවා. ජෝගුවක්ම එකතු කරන්න ගියොත් මහන්සිය නිසා පණ නැතිවෙයි. මම ගිහින් තව පැත්තක බලන්න ඕන.

කොළ යට හැංගෙන්නේ නැති ස්ට්‍රෝබෙරි ගෙඩි තියෙන පැත්තක් හොයන්න ශේන්යා කැලෑව මැදින් ඇවිදගෙන ගියා.

ඇය බොහෝ දුරක් ඇවිදගෙන ගියා. ඒත් ඒ වගේ ස්ට්‍රෝබෙරි ගෙඩි තිබෙන පැත්තක් හමුවුණේ නැහැ.

ශේන්යාට මහන්සි දැනුණ නිසා ඇය ගහක් මුල වාඩි වුණා.

ඇය ඉඳගෙන නිකන්ම ඉන්න අතරෙදි ජෝගුවේ තිබුණු ස්ට්‍රෝබෙරි ගෙඩි එක දෙක අරගෙන කන්න පටන් ගත්තා.





අන්තිමේදී ඇය ගෙඩි අටම කාල ඉවර කළා.

දැන් ඉතින් මොනව කරන්නද? කාගෙ හරි උදව්වක් තමයි දැන් ඕන වෙන්නෙ.

ඇය එහෙම හිතනවත් එක්කම බිම තිබුණු පෙඳ පාසි සෙලවෙන්න පටන්ගත්තා. තණකොළ දෙපැත්තට වුණා.

ශක්තිමත් පෙනුමක් තිබුණු පුංචි මහලු මිනිසෙක් පඳුරක් අතරින් එළියට ආවා. ඔහු සුදුපාට කබායක් හැඳගෙන දිග සුදු රැවුලක් ඇතිව තණ පතක් ගහපු විල්ලුද තොප්පියක් දමාගෙන සිටියා.



"ආයුබෝවන් ගැහැනු ළමයො." ඔහු කිව්වා.


"ආයුබෝවන් මාමෙ. "

"මම මාමා කෙනෙක් නෙවෙයි. මට සීයා කියලා කියන්න. ඔයාට මාව අඳුන ගන්න බැරිද? මම බරාවික් බිම්මලක්. ආදිවාසී කැලෑ මිනිසෙක්. හැම බිම්මලකම එතකොට හැම රට ඇඹිල්ල වර්ගයකම නායකයා මම තමයි. ඇයි ඔයා දුකෙන් ඉන්නෙ. ඔයාට කරදරයක් කළාද කවුරුහරි?"

"ස්ට්‍රෝබෙරි ගෙඩි මාව තරහ ගැස්සුවා සීයෙ."

"එහෙම වෙන්න බෑ. ස්ට්‍රෝබෙරි හරිම බයාදුයි. ඒවා කොහොමද ඔයාව තරහ ගස්සන්නෙ"

"ඒවා මට පේන්න ඉන්නෙ නැහැ. ඒවා කොළ යට හැංගෙනවා. ඉතින් එකක්වත් හිටගෙන ඉඳන් බැලුවම පේන්නෙ නැහැ. පහතට නැවෙන්න ඕන! නැවෙන්න ඕන! ජෝගුවක් පුරවගන්න තරමට



කඩන්න ගියොත් හරිම වෙහෙසයි."

මහලු බරාවික් ආදිවාසී කැලෑ මිනිසා මුලින් සුදු යටි රැවුල අතගාල, ඊට පසුව උඩු රැවුල ඉහළට එසවෙන තෙක් හිනා වෙලා මෙහෙම කිව්වා.

"හරිම සුළු දෙයක්නෙ! ඒ වැඩේට මා ළඟ තියෙනවා නළාවක්. ඒ නළාව නාද වෙන්න පටන් ගත්තාම කොළ යට හැංගිලා ඉන්න ස්ට්‍රෝබෙරි එළියට එන්න පටන් ගන්නවා."

මහලු බරාවික් ආදිවාසී කැලෑ මිනිසා එයාගේ සාක්කුවෙන් නළාවක් එළියට ගත්තා.

"නළාව! නාදය පටන් ගන්න."

ඔන්න දැන් නළාව තනිවම නාද වෙනවා. අවට හැම පැත්තකින්ම කොළ යට හැංගිලා හිටිය ස්ට්‍රෝබෙරි ගෙඩි එළියට එන්න පටන් ගත්තා.

"නළාව! නාදය නවත්තන්න."

නළාවේ නාදය නැවතුණා. එළියට ආ ස්ට්‍රෝබෙරි ගෙඩි ආපහු හැංගුණා. ශේන්යාගේ සතුට ඉහ වහ ගිහින්.

"සීයා! සීයා! ඔය නළාව මට දෙන්නකෝ."

"බැහැ. ඒක දෙන්න බැහැ. ඒත් අපි මෙහෙම කරමු. අපි හුවමාරුවක් කරගමු. ඔයා මට ඔය ජෝගුව දෙන්න. මම ඔයාට මේ නළාව දෙන්නම්. මට ඒක දැක්කම ආස හිතුණා."

"අන්න හරි.. එහෙම හොඳයි."

ශේන්යා මහලු බරාවික් ආදිවාසී කැලෑ මිනිසාට තමන් ළඟ තිබුණු ජෝගුව දීලා, නළාව ඉල්ලගෙන තමන්ගේ තණබිම්කඩට දුවලා ගියා පුළුවන් තරම් වේගයෙන්. තණබිම මැද සිටගත් ඇය මෙහෙම කිව්වා.

"නළාව! නාදය පටන් ගන්න."

නළාව නාද වෙන්න පටන් ගත්තා. දැන් ඔන්න තණබිමේ තියෙන කොළ සෙලවෙනවා හරියට හුළඟකට අහු වෙලා වගේ.

මුලින්ම කුතුහලයෙන් පිරුණු ළාබාල ස්ට්‍රෝබෙරි ගෙඩි කොළ යට ඉඳන් එබිල බලන්න පටන් ගත්තා. ඒවා තවමත් කොළ පාටයි. ඊට පිටුපසින් ඔවුන්ට වඩා වැඩිමහලු ස්ට්‍රෝබෙරි ගෙඩි එබී බැලුවා. ඒවායින් සමහර ඒවා රෝස පාටයි, තවත් සමහර ඒවා සුදුපාටින් පෙනුණා.

ඔන්න ඊට පසුව තමයි ඉදුණු රතු පාට ගෙඩි පෙනී ඉන්න පටන් ගත්තේ. අන්තිමටම පෙනී හිටියේ මහලු කළු පාටට හැරුණු කහපාට ඇටවලින් පිරී තිබෙන ස්ට්‍රෝබෙරි ගෙඩි.

වැඩි වෙලාවක් ගත වෙන්න කලින් ශේන්යා වටා තිබුණු මුළු තණබිමම නළාවේ හඬ ඇහිලා කොළ යට ඉඳන් එළියට ආපු ස්ට්‍රෝබෙරි ගෙඩිවලින් වැසී ගියා. ඒවා හිරු එළිය වැටිලා දීප්තිමත්ව බබළනවා.



"නද දෙන්න! නළාව නද දෙන්න! තවත් නද දෙන්න!" ශේන්යා කෑ ගැහුවා. නළාව වේගයෙන් නාද වෙන්න පටන් ගත්තා. දැන් තව තවත් වැඩියෙන් ස්ට්‍රෝබෙරි ගෙඩි කොළ යට ඉඳන් එළියට එන්න පටන් ගත්තා. ඒවා කොතරම්ද කියනව නම් දැන් ඒවාට යටින් එක කොළයක්වත් පේන්න නැහැ.


ඒත් ශේන්යා නවත්තන්නේ නැහැ.

"නද දෙන්න! නළාව නද දෙන්න! තවත් හයියෙන් නද දෙන්න!"

දැන් නළාව කලින්ටත් වඩා වේගයෙන් නාද වෙනවා. මුළු කැලෑවම සුමිහිරි සංගීත නාදයෙන් පිරිලා ඉතිරිලා ගියා. දැන් මුළු කැලෑවම සංගීත මංජුසාවක් වගේ.

මී මැස්සෝ සමනලයන්ව මල්වලින් එළියට තල්ලු කිරීම නවතා දැමුවා. සමනල්ලු පොතක පිටු පෙරළෙනවා වගේ තමන්ගේ පියාපත් වනන්න පටන් ගත්තා. මල්බෙරි ගසක අතුඋඩ හදා





තිබුණු කූඩුවේ සිටිය පුංචි රොබින් කුරුලු පැටවුන් උද්දාමයට පත් වෙලා ඔවුන්ගේ පුංචි කහපාට හොට ඇති කටවල් ඇරගෙන බලා ඉන්න වුණා. බිම්මල් ඇඟිලි තුඩුවලින් ඇවිදින්න පටන් ගත්තේ සංගීතයට බාධාවක් වෙයි කියල හිතපු නිසා. කිසිම දෙයක් රුස්සන්නේ නැති කෙනෙක් කියල හැමදෙනාම කියන යෝධ ඇස් බෝල මහලු බත්කූරා පවා මේ සංගීතයෙන් මුසපත් වෙලා හිටි තැනම නැවතිලා සංගීතයට කන් යොමා ගෙන ඉන්න වුණා.

හරි, දැන් මම ස්ට්‍රෝබෙරි එකතු කරන්න පටන් ගන්නවා. ශේන්යා හිතුවා. එහෙම හිතලා වැඩියෙන්ම රතු පාට, වැඩියෙන්ම ලොකු ස්ට්‍රෝබෙරි ගෙඩි ළඟට කිට්ටු වුණා. එත් එතකොටම තමයි ඇයට එක් වරම මතකයට ආවේ තමන් නළාව ඉල්ල ගත්තේ ජෝගුව දීල බව. දැන් ඉතින් ස්ට්‍රෝබෙරි දාගෙන යන්න බඳුනක් නැහැ නොවැ.



"නළා මෝඩයෝ" ශේන්යා තරහින් කෑ ගැහුවා. "දැන් මම ස්ට්‍රෝබෙරි දාගෙන යන්නෙ මොකකද? නුඹ තාමත් කෑ ගහනවා. කට වහනවා. "

ශේන්යා ආපසු ආදිවාසී කැලෑ මිනිසා මහලු බරාවික් වෙත දුවල ගියා.


"සීයා.. සීයා.. මට ආපහු මගේ ජෝගුව දෙන්න. මට ස්ට්‍රෝබෙරි දාගෙන යන්න බඳුනක් නැහැ."

"හොඳයි!" මහලු බරාවික් ආදිවාසී කැලෑ මිනිසා උත්තර දුන්නා.

"මම ඔයාට ජෝගුව ආපහු දෙන්නම්. හැබැයි ඔයා මට මගේ නළාව ආපහු දෙන්න ඕනෑ."

ශේන්යා මහලු බරාවික් ආදිවාසී කැලෑ මිනිසාට නළාව දීලා ජෝගුව ඉල්ලාගෙන හැකි ඉක්මනින් ආපසු තණ බිමට දුවල ගියා.

එත්, ඇය ආපසු එද්දී එක ස්ට්‍රෝබෙරි ගෙඩියක්වත් පේන්න නැහැ. කොළ විතරයි. හරිම අවාසනාවක් තමයි. දැන් ස්ට්‍රෝබෙරි දාගෙන යන්න ජෝගුව තියෙනවා. ඒත් ඒවා ආපහු ගෙන්වා ගන්න නළාව නැහැ.



ශේන්යා හිතුවා.. හිතුවා.. හිතල තීරණය කළා මහලු බරාවික් ආදිවාසී කැලෑ මිනිසා ආපසු හමු වීමට යන්න.

"සීයා.. සීයා.. මට නළාව ආපහු දෙන්න."

"හොඳයි.. එහෙම නම් මට ජෝගුව ආපහු දෙන්න."

"බැහැ.. බැහැ.. මට ස්ට්‍රෝබෙරි ටික ගෙදර ගෙනියන්න ඒක ඕන වෙනවා."

"එහෙම නම් මම නළාව දෙන්නෙ නැහැ."

ශේන්යා ඇවිටිලි කළා. "අනේ සීයා... ඔයා හිතන්න මම නළාව නැතිව කොහොමද මගේ ජෝගුව ස්ට්‍රෝබෙරිවලින් පුරව ගන්නෙ. එයාල නළාවේ සංගීතය නැතිවුණාම කොළ යට හැංගෙනවා. මා ඉදිරියේ පෙනී ඉන්නෙ නැහැ."

"ඕ...හෝ.. කපටි කෙල්ල. ජෝගුවයි නළාවයි දෙකම එයාට ගන්න. ඔයාට නළාව ඕන වෙන්නෙ නැහැ ඔය වැඩේට. ජෝගුවෙන් විතරක් පුළුවන්."



"මට එක කරන්න බැහැ සීයා. අනික් අය කරන්නෙ කොහොමද දන්නවද?

අනික් අය බිමට පහත් වෙනවා. පහත් වෙලා කොළ යට බලනවා. ගෙඩියෙන් ගෙඩිය කඩනවා.. තවත් එකක් ගැන බලනවා. තුන් වෙනි එක ඊළඟට... ඊට පස්සේ හතර වෙනියා... මම කැමති නැහැ එහෙම එකතු කරන්න. බිමට නැවෙනවා... බිමට නැවෙනවා... ජෝගුවක් පුරවන්න තරම් කඩා ගනිද්දි හොඳටම මහන්සි වෙලා තියෙයි.

"ආ... ඒකයි මේ..." මහලු බරාවික් ආදිවාසී කැලෑ මිනිසා කිව්වා. ඔහුට කොතරම් තරහක් ආවද කියනව නම් ඔහුගේ සුදු රැවුල කළු පාටට හැරුණා." දැන් තමයි මට තේරෙන්නෙ ඔයාගෙ කම්මැළිකම ගැන. ඔය ජෝගුවත් අරගෙන මෙතනින් පිටවෙලා යන්න. ඔයාට දෙන්න නළාවක් මෙහෙ නැහැ."



මහලු බරාවික් ආදිවාසී කැලෑ මිනිසා මෙහෙම කියනවත් එක්කම මහා හයියෙන් අඩිය පොළොවේ හප්පලා ලී කොටය යටින් නොපෙනී ගියා.

ශේන්යා ඇගේ හිස් ජෝගුව දිහා බැලුවා. ඇයට මතක් වුණා තාත්තා, අම්මා සහ පාව්ලික් මල්ලී ඇය එනතෙක් බලා සිටින බව. ඇය හණික තණ බිමට දුවලා ගියා. ගිහින් බිම ඇන තියාගෙන අනික් අය වගේ කොළවල යටි පැත්ත බැලුවා. ඔන්න ශේන්යාත් ස්ට්‍රෝබෙරි ගෙඩි එකින් එක කඩන්න පටන් ගත්තා.

ඒක ගෙඩියක් මම කඩනව - තවත් එකක් ගැන බලමින්
තුන්වෙනියත් මට පෙනෙනව - හතරවෙනිය එබී බලයි.

බොහොම ඉක්මනින් ශේන්යාගේ ජෝගුව සම්පූර්ණයෙන් ස්ට්‍රෝබෙරිවලින් පිරී ගියා. ඇය ජෝගුවත් අරගෙන අම්මා තාත්තා පාව්ලික් මල්ලී ළඟට ගියා.

"මෙන්න දක්ෂ කෙල්ලක්." තාත්තා ශේන්යා දකිද්දී කිව්වා. "ජෝගුවක් පුරවගෙනම ඇවිත්. ඔයාට මහන්සිද?"

"නෑ තාත්තා... ජෝගුව මට උදව් කළා."

ඔන්න දැන් ඉතින් හැමෝම ගෙදර යනවා. තාත්තා ළඟ කට ළඟටම ස්ට්‍රෝබෙරි පිරුණු ලොකු කෝප්පයක්. අම්ම ළඟත් ඒ වගේම පිරුණු පුංචි කෝප්පයක්. ශේන්යා ළඟ පිරුණු ජෝගුවක්. පාව්ලික් මල්ලිගේ පීරිසිය පිරෙන්නත් ස්ට්‍රෝබෙරි තිබුණා.

හැබැයි ශේන්යා නළාව ගැන නම් කවදාවත් කාටවත්ම කිව්වේ නැහැ.



# ලී කොටය







ඔන්න මේ කැලෑවේ තිබුණා කඩා වැටුණු ගසකින් ඉතුරුවුණු පරණ කොටයක්. දවසක්දා එක ආත්තම්මා කෙනෙක් මේ කොටය ඉදිරිපිටට ඇවිත් හිස නමලා ආපහු යන්න ගියා. තවත් තරබාරු පුංචි ගැහැනු ළමයි දෙදෙනෙකුත් ඇවිත් කොටයට හිස නමල යන්න ගියා. ඔන්න ඊළඟට තවත් මහලු සීයා කෙනෙක් මල්ලකුත් කිහිලි ගන්නාගෙන ආව. එයත් මේ කොටයට හිස නමල ඈතට ඇවිදගෙන යන්න ගියා.

ඔය විදිහට ඉතින් මුළු දවස පුරාම එක එක විදිහේ ගැහැනු. පිරිමි, ඇවිදින් මේ පරණ කොටයට හිස නමලා යන්න ගියා.

මේ දේ දැකපු පරණ කොටය ආඩම්බර වෙලා, අනික් ගස්වලට කතා කරල මෙහෙම කියන්න පටන් ගත්තා.

"නුඹලාට පේනවා නේද? අර ආත්තම්මා ඇවිත් මට හිස නමල ආචාර කළා. පුංචි ගැහැනු ළමයි ඇවිත් මට ආචාර කළා. අර මහලු සීයත් ඇවිත් මට අචාර කළා. මෙතැන පහු කරගෙන ගිය කිසිම කෙනෙක් මට ආචාර කරන්න අමතක කළේ නැහැ. නුඹලාට පේනවා නේද මම තමයි මේ කැලෑවේ පාලක. නුඹලාත් මට හිස නමා ආචාර කළ යුතුයි."

ඒත් මේ සරත් සමයේ විවිධාකාර පාටින් ලස්සනට හැඩවෙලා සිටි ගස් ආඩම්බරයෙන් නිශ්ශබ්දව බලා සිටියා විතරයි.

මේක දැකලා හොඳටම කෝප වුණු ලී කොටය කලින්ටත් වඩා මහ හයියෙන් බෙරිහන් දෙන්න පටන් ගත්තා.

"මට ආචාර කරපල්ලා! මමයි නුඹලාගේ රජ්ජුරුවෝ" රන්වන් පාට කොළ එකින් එක හැලෙමින් තිබුණු එක් බිරියෝසා ගසක අත්තක් උඩට ඔන්න එතකොටම පියාඹා ඇවිත් වැහුවා පුංචි කඩිසර බට්ටිච්චියක්. ඇය හිනා වෙවී කිචි බිචි සද්දෙන් මෙහෙම කිව්වා.

"මොකක්ද මේ කැලේ දෙවනත් වෙන්න ඇහෙන සෝෂාව ! කට වහනවා! ඔයා රජෙක් නෙවෙයි. ඔයා නිකම්ම නිකං පරණ ලී කොටයක් විතරයි. මෙතනින් යන මිනිස්සු කවුරුත් ඔයාට හිස නමල ආචාර කරන්නෙ නෑ. එයාල බලන්නෙ ඔය කොටය පාමුල මී පැණි තියෙනවද කියල, පහතට නැවිලා. ඒත් එයාලට ඒවා ලැබෙන්නේ නැහැ. මොකද ඒවා කවුරු හරි කෙනෙක් එකතු කරගෙන ගිහින් ගොඩක් කාලෙකට කලින්.



# බිම්මල්







ශේන්යා සහ පාව්ලික් තමන්ගේ නෑ සොයුරිය ඊනොව්කා බලන්නට නගරයේ සිට පැමිණියා.

"හොඳයි ළමයිනේ, ඇයි මෙහෙම වාඩි වෙලා බලන් ඉන්නෙ?" අම්මා ඇහුවා.

"යන්න කැලෑවට. ගිහින් බිම්මල් එකතු කරගෙන එන්න."

"අපි බලමු කවුද හොඳම බිම්මල් එකතු කරගෙන එන්නෙ කියල."

"මං තමයි හොඳම, හොඳම, එව්වා එකතු කරන්නෙ." පාව්ලික් කිව්වා.

"නැහැ, මමයි හොඳම එව්වා." ශේන්යා කිව්වා ඊනොව්කා මොනවත්ම කිව්වේ නැහැ. ඇය කොහොමත් නිශ්ශබ්ද ගැහැනු ළමයෙක්.

ළමයි තුන්දෙනා කැලයට දුවල ගිහින් තුන් පැත්තකට බෙදුණා. ඔවුන් ආපහු ආවේ පැයකට පසුව.

"මම තමයි හොඳම එව්වා එකතු කළේ. පාව්ලික් ඈත ඉඳන්ම කෑ ගැහුවා. මා ළඟ තමයි වැඩිපුරම තියන්නෙ. තියෙනවා බාල්දිය පිරෙන්නම.'

අම්මා බාල්දිය ඇතුළ බැලුවා. ඇය හිනා වුණා.

"බාල්දිය පිරුණට විතරක් මදි. එකම හොඳ බිම්මලක්වත් නෑ. සේරම තියෙන්නෙ නයි හතු. පාව්ලික් යාළුවා! බිම්මල් එකතු කළාට විතරක් මදි ඒවා හොඳ ඒවා වෙන්නත් ඕන."

"අහා. දැක්ක නේද? මම අම්මට කිව්වනේ මම තමයි හොඳම බිම්මල් එකතු කරන්නෙ කියල. මා එකතු කරල තියනවා ලොකුම ලස්සන හතු. සුදුපාට තිත් වැටිලා තියෙන රතුපාට එව්වා. ඒ වගේ ලස්සන බිම්මල් කා ළඟවත් නෑ." ශේන්යා කිව්වා.

අම්මා ඒ දිහා බලල හිනා වුණා.

"අනේ ළමයො. මේවා මැසි බිම්මල්. ඒවා ලස්සන වුණාට ඒවායෙන් වැඩක් නෑ ඒවා කෑවොත් විස වෙනවා. ඔයා ගැන කිව්වත් ඔයත් බිම්මල් එකතු කිරීමට දක්ෂ නැහැ ශේන්යා."

ඊනොව්කා පැත්තකින් හිටගෙන නිහඬව හිටියා.

"ඊනොව්කා. මොකද ඔයා කතා නැතිව ඉන්නෙ? ඔයා එකතු කරපුව පෙන්නන්නකො බලන්න මට."

"මම පොඩ්ඩයි එකතු කළේ." ඊනොව්කා ලැජ්ජාවෙන් කිව්වා.




අම්මා ඊනොච්කාගේ කූඩය දිහා බැලුව. ඒකෙ ඉස්තරම්ම බිම්මල් දහයක් තිබුණා. රෝසපාට ලස්සන මල් වගේ සෙරයියෂ්කා බිම්මල් දෙකක්, චීන හිස් වැසුම් දාගෙන ඉන්න කහපාට ලිශීකා බිම්මල් දෙකක්, පදාර්ශන චික් සහ පද්මිරියෝස චික් කියන බිම්මල් දෙමස්සිනලා දෙන්නෙකුත්, කිරි බිම්මලක් රිෂික් හත්තක්, වොනුෂ්කා බිම්මලක් සහ ඔවුන් කාගේත් ප්‍රියතම ලොකු බඩක් ඇති බරාවික් බිම්මලකුත් හිටියා විල්ලුද හිස් වැස්මක් දාගෙන. ඒ විතරක් නෙවෙයි, හරිම ෂෝක් පැණි බිම්මල් පොකුරක්ම ඒ එක්කම තිබුණා.



# මුතු ඇටය







ආර්කාඩියා මුහුදු වෙරළට කිට්ටුව කළු මුහුදේ ජීවත් වුණා ලස්සන මාළුවෙක්, කරලීනා, ඈ තරුණ සුල්තානා මාළුවෙක්. මුහුද යට රාජධානි වාසීන් හැමෝම ඇගේ රූප ශෝභාව වර්ණනා කළා. ඇය ඉතා කුඩා වයසේ දී මුළු දවසම ගත කළේ අනික් මාළුන් සහ මුහුදු ජීවීන් සමඟ එහා මෙහා පීනමින්, ක්‍රීඩා කරමින්, ඔවුන්ගේ මේ කෙළි සෙල්ලම් නිසා ඇති වුණු වැලිසුළි නිසා බිය වැද්දුණු තාපස කකුළුවන් ගුරුලේත්තුවල හැඩය ගත් ඔවුන්ගේ ගෙවල් තුළට රිංගා ගත්තා. ඒත් ඇය තමන්ගේ කාන්තිමත් චරිත ලක්ෂණ, කඩිසර බව සහ ප්‍රසන්න පෙනුම නිසා ඔවුන්ගේ පවා

සිත් දිනා ගත්තා. ඇත්තෙන්ම ඈ මනෝහර දැරිවියක්.

කරලීනා වැඩි වියට පත්වෙලා විනිවිද පෙනෙන රන්වන් පාට වලිගයක්, ළා තැඹිලි පාට වරල්, කුඩා කටක් සහ විශාල මරකත මැණික් වගේ ඇස් දෙකක් ඇති තරුණ මාළුවෙක් බවට පත් වුණාම හැමෝටම පෙනුණා ඇය සැබෑම රූමතියක් බව.

ඇත්ත තමයි ඇගේ සමහර මිතුරියන් කිව්වා ඇය පුරාජේරුකාර ගැහැනු ළමයෙක් කියල. එත් මට හිතෙන්නේ නම් ඔවුන් එහෙම කිව්වේ ඊර්ෂ්‍යාව නිසා.





ඔන්න මේ වෙද්දී කරලීනාගේ අතපතාගෙන තරුණයන් වැල නොකැඩී එන්න පටන් ගත්තා. ඇත්තෙන්ම ඕනෑම කෙනෙකුට ඇය එක් වරක් දැක්ක හැටියේම ඇය සමඟ ආදරයෙන් බැඳෙන්න හිතෙනවා.

අශ්වාරෝහක හමුදා පාසලෙන් උපාධි ලබා පිටවුණු මුහුදු අශ්වයෝ දෙදෙනෙක් දවසක් ඇගේ නිවසේ ජනේලය ඉස්සරහදී පොර බදන්න පවා සූදානම් වුණා. ඒත් කරලීනා ඔවුන් දෙදෙනාව සන්සුන් කළේ දෙදෙනාටම තමන්ගේම සහෝදරයන් දෙදෙනෙකුට වගේ එකම විදිහට ආදරය කරන බව කියමින්. තමන්ට විවාහ වීමේ අදහසක් නැති බව ඇය ඔවුන්ට කියා සිටියා.

බිචොක් මාළුවෙක් වුණු ලියැන්ඩර් අපූරු කවි ලිවීමේ හැකියාවක් උරුම කරගෙන සිටි නැඟී එන කවියෙක්. ඔහු විසින් පුංචි මුතුබෙලි කටු මහ ගොඩක ලියන ලද අෂ්ටපද කවි විසිතුරු පෙට්ටියක දමා කරලීනා වෙත එව්වා.



සුප්‍රසිද්ධ සහ පළපුරුදු දන්ත වෛද්‍යවරයෙක් වුණු ප්‍රදේශයේ ජීවත් වුණු හැම ඩොල්ෆින් කෙනෙක්ගේම දත් පිරවීම සහ මුවහත් කිරීම් කරපු මහලු මඩු මාළුවෙක් වුණු අන්තෝනියෝ කරලීනාට දවස ගානේ ඉතාම මිල අධික තෑගි එව්වා. ඔහු එක ඉරිදා දවසක තමාම කරලීනා හමු වෙන්න ඇවිත් ඇයට විවාහ යෝජනා කළා.

ඇයට විවාහ යෝජනා කළ තවත් බොහෝ අය හිටියා වුණත්, ඒ අයගේ කැපී පෙනෙන විශේෂත්වයක් නොතිබුණු නිසා ඒ හැම කෙනාම ගැන විස්තර කරන්නට යාම මේ කතාව දීර්ඝ නීරස එකක් බවට පත් කරනවා විතරයි.



ඉතින් අපේ සුන්දර කරලීනා ළෙන්ගතු සිනාවකින් මුහුණ සරසාගෙන මේ විවාහ අපේක්ෂිතයන් හැම දෙනාටම මෙහෙම කිව්වා.

"ඔබ හැම දෙනාම විවාහ යෝජනා ගෙන එමින් මා හට දැක්වූ ගරු බුහුමනට ස්තුති වන්ත වන ගමන්ම, ඇත්තෙන්ම මට කියන්න සිද්ධ වෙනවා මම තවමත් කිසිම කෙනෙකුට ආදරය කරන්නෙ නැති බවත්, තවමත් කිසිම කෙනෙක් සමඟ විවාහ වීමට අදහසක් මට නැති බවත්. ඇත්තම කියනවා නම් මම ඔය හැම දෙනාටම කැමැතියි. ඒත් මට තවත් ටික කාලයක් නිදහසේ ඇවිද යන්න ඉඩ දෙන්න. තවත් අවුරුද්දකට පසුව මා වෙත එන්න. එදාට මම හැමෝටම පිළිතුරක් දෙන්නම්."

මේ කතාව අහපු විවාහ අපේක්ෂකයෝ පිටවෙලා යන්න තීරණය කළා, සිත් වේදනාවෙන් වුණත් ඇයගේ රූපය වගේම සුවිනීත හැසිරීම නිසා කලින්ටත් වඩා ඇයට වශී වෙලා. ඒත් ඔවුන්ගෙන් කිසිම කෙනෙක් ඇය ගැන බලාපොරොත්තු නැති කර ගත්තේ නැහැ, තවත් අවුරුද්දකින් කැමැත්ත ලැබෙයි කියල ඇතිකරගත් විශ්වාසය නිසා.

ඔහොම ඉන්න අතරතුරදී දවසක් බාල් නැටුමට යන්න මුහුණ බලන කණ්ණාඩිය ඉදිරිපිට ඉඳන් සූදානම් වෙද්දි කරලීනා දැක්කා ඇයගේ එක ඇලයකට වෙන්න වරලට යටින් පුංචිම පුංචි බිබිළක් තියෙන හැටි. ඒක පුංචි වැලි කැටයක් තරමේ එකක් වුණා.

ඒත් කරලීනා ඒ ගැන වැඩියෙ කරදර නොවී එයට උඩින් පුයර ටිකක් තවරාගෙන බාල් නැටුමට පිටත් වෙලා යන්න ගියා.

ඒත් දවස් කීපයක් ගතවෙලා යද්දී කරලීනා දැක්කා ඒ බිබිළ අබ ඇටයක් තරම් විශාල වෙනකම් වැඩිලා. එයින් ඇයට කිසිම අපහසුවක් දැනුණේ නැති වුණත්, ඇය බියට පත් වුණා.

එක මොහොතක්වත් පමා නොවී ඇය පිටත් වුණා ඇගේ දුර නෑයෙක් වන මහලු කුම්බලා මාළුවෙක් වුණු ෆියානාව හමු වෙන්න. මහලු ෆියානා ජීවත් වුණේ ගැඹුරු මුහුදු පතුලේ වැලි යට සැඟවිලා.



කිසිම මුහුදු වැසියෙක් ඇය සමඟ සමාගම් පැවැත්වූයේ නැහැ. ඒ වගේම ඇය මන්තරකාරියක් කියන කටකතා පවා පැතිරිලා තිබුණා.

මහලු ෆියානා තමන්ගේ ඉබිකටු ඇස් කණ්ණාඩි කුට්ටම දමාගෙන කරලීනාගේ වරලට යටින් හැදී තිබුණු බිබිළ බොහෝ වෙලාවක් යනකම් පරීක්ෂා කළා.

ඔන්න අන්තිමේ දී බොහොම බැරෑරුම් විදිහට ඇය මෙහෙම කියන්න පටන් ගත්තා. "මගේ දයාබර දුවේ. ආදරණීය ලේළියේ, නුඹට දුක් වෙන්න කිසිම හේතුවක් නැහැ. ඇත්තටම කියනවා නම් සිද්ධ වෙන්න යන්නේ හරිම සතුටුදායක දෙයක්. නුඹේ මේ වරලට යටින් හැදිලා තියන්නෙ වෙන කිසිම දෙයක් නෙවෙයි. විස්මිත හැඩයක් ඇති, අසම සම මුතුඇටයක්. "



"කෝ... කොහොමද මුතුඇටයක්?" තදින්ම පුදුමයට පත් වුණු කරලීනා කෑ ගැසුවා. "ඒත්... ඒත් අපට පාසලේ දී උගන්නල තියන්නෙ මුතුඇට උපදින්නෙ බෙල්ලන්ගෙන් කියල."

"හරියට හරි." පියානා මැහැල්ල කිව්වා. "සාමාන්‍ය සිරිතේ හැටියට මුතුඇටයක් උපදින්නෙ බෙල්ලෙක් ඇතුළේ තැන්පත් වෙන වැලි ඇටයක් නිසා තමයි. ඒත් විශේෂ දේත් සිද්ධ වෙන වෙලාවල් තියෙනවා. මගේ එක මායා පොතක ලියවිලා තියෙන විදිහට සමහර කලාතුරකින් අවස්ථාවල මුතුඇට මාළුන්ගේ වරල් යටත් උපදිනවා.

එහෙම ඉපදුණොත් ඒ මුතුඇටය කාලය ගත වෙද්දී සාමාන්‍ය මුතුඇටයකට වඩා විශාල කිසිම ඇදයක් කුදයක් නැති හරිම රවුම්



අසම සම ලස්සනක් තිබෙන මුතුඇටයක් බවට වැඩෙනවා. මේක ලොකුම ලොකු වාසනාවක්. ඇත්තටම, බොහොම කලාතුරකින් සිද්ධ වෙන දෙයක්. අවුරුදු සීයකට එහෙම නැති නම් දෙසීයකට එක වතාවක්. මොකද දන්නවද මගෙ දුවේ, ඒ වගේ මුතුඇටයක් උපදින මාළුවෙක් ඉන්නවා නම් ඒ මාළුවා බොහොම බුද්ධිමත් දුර්ලභ රූප ශෝභාවක් ඇති මාළුවෙක් වෙන්නම ඕනෑ නිසා. එහෙම මාළු උපදින්නෙ බොහොම කලාතුරකින්."





"ඕ... එහෙම නම් මේක අරුම පුදුම මාණික්‍යයක්." කරලීනාගේ සතුට ඉහවහා ගිහින් තිබුණා. ඇය තමන්ගේ ගෙදර බලා පිටත් වෙන්න පටන් ගත්තෙ සිනහවෙමින්. ඇය ඇගේ වරල පරිස්සමට ඇඟට තියා තදකර ගත්තෙ මේ වටිනා මුතුඇටයට හානියක් වෙයි කියල ඇති වුණු බිය නිසා.

ඔන්න එදා දවසේ ඉඳන් කරලීනාගේ දින චර්යාව පුදුමාකාර විදිහට වෙනස් වෙන්න පටන් ගත්තා. ඇය බාල් නැටුම් මඟ හැරියා. නැටුම්වලට සම්බන්ධ වීමට අකැමැත්තක් පෙන්නුවා. වෙනදා එකට දුව පැනපු කෙළිකවටකම් කරපු මිතුරන් මිතුරියන් පුළුවන් හැම විදිහටම මඟ හැරියා. ලස්සන කරලීනා නිහඬ, හැම වෙලේම කල්පනාවට වැටී සිටින කෙනෙක් බවට පත්වුණා.

කරලීනා, මොකද ඔයාට වෙලා තියන්නෙ? ඔයා අසනීපෙන්ද? ඇගේ මිතුරියෝ ඇයගෙන් ඇහුවා.

නෑ. ස්තුතියි. මම බොහොම හොඳින්.

එහෙම කියද්දී අබිරහස් අහංකාර හිනාවක් ඇයගේ සුන්දර මුහුණේ ඇති වුණා.

ඈ තනිකම සමඟ ආදරයෙන් බැඳුණා. මෙහෙම තනිවෙලා ඉන්න අතරෙදි නිතර නිතර ඇගේ ආභරණ පෙට්ටියෙන් කුඩා මුහුණ බලන කණ්ණාඩියක් එළියට ගන්නා ඇය, එයින් මුතුඇටය දිහා බොහෝ වේලාවක් බලාගෙන ඉන්නවා.

"අනේ.. මගේ මේ මුතුඇටය කොයිතරම් හෙමින්ද ලොකු වෙන්නෙ." කරලීනා තමන්ටම කියා ගත්තා. කොහොම වුණත් එහෙම හෙමින් ලොකුවෙනව කියන එකේ තේරුම ඒක ලොකු වුණාට පස්සේ ගොඩක් වටින එකක් වෙනව කියන එකනෙ. ඒක රටකොට්ටන් ඇටයක් තරම් ලොකු වුණාට පස්සේ. නෑ, සමහරවිට අලිගැටපේර ඇටයක් තරම් ලොකු වෙයි, ඊට පස්සේ ආභරණ වෙළෙන්දා මට ලොකුම මුදලක් ගෙවාවි. එතකොට මම තමයි මේ ලෝකෙ ඉන්න පොහොසත්ම මාළුවා. එක හෙමින් හෙමින් වැඩුණාවෙ. මට හදිස්සි නෑ. තාමත් මට මගේ මුළු ජීවිත කාලයම ඉතුරු වෙලා තියෙනවනෙ.

අවුරුද්දක් ඔය විදිහටම ගතවෙලා ගියා. ඔන්න මුහුදු අශ්වයෝ දෙදෙනා ඈව සොයාගෙන ආවා ඔවුන්ගේ යෝජනාවට ඇගෙන් පිළිතුරක් බලාපොරොත්තුවෙන්.

කරලීනා ඔවුන්ගේ පරණවෙලා සායම් ගිය නිල ඇඳුම් දිහා බලල මෙහෙම කිව්වා.

"අපොයි නැහැ යාළුවනේ. අපි මේ කාරණාව ගැන තවත් මොනවත්ම කතා නොකර ඉඳිමු. මම ඔය දෙන්නගෙන් කිසිම කෙනෙක්ව කවදාවත් කසාද බඳින්නෙ නැහැ. එහෙනම් ආයුබෝවන්!"



"ඒත්.. ඒ වුණත් ලස්සන කරලීනා." එක් මුහුදු අශ්වයෙක් කිව්වා. "අඩුම ගානේ අපට සුබ පතලා කියන්න අපට ඔයාගේ සහෝදරයන් හැටියට සලකලා ආදරෙයි කියලවත්. එතකොට හරි අපේ දුක තුනී වෙලා යාවි."

"අයියෝ.. මට ඔයාලට එහෙම පොරොන්දුවක් දෙන්නත් බැරි වෙයි." කරලීනා උත්තර දුන්නා.

"ඇයි. ඒ මොකද?" මුහුදු අශ්වයෝ දෙදෙනා පුදුමයෙන් ඇහුවා.

"මොකද කියනවා නම් ඔයාල මට දුප්පත් වැඩියි. ඒක මට ලැජ්ජාවක්. ඒත් ඉතින් ඔයාලා ඒකට මොනවා කරන්නද? නේද? ජීවිතේ හැටි ඔහොම තමයි."

"ඒත් අපි දෙන්නගෙන් ඕනෑම කෙනෙක් ඕනෑම වෙලාවක දී සූදානම් ඔයා වෙනුවෙන් අපේ ජීවිතේ වුණත් කැප කරන්න." මුහුදු අශ්වයෝ දෙදෙනා ආපහු කිව්වා.

"අනේ අවාසනවන්තයිනේ, මගේ වස්තුවේ වටිනාකම ඔය වගේ මුහුදු අශ්ව ජීවිත දෙකකින් ගෙවන්න බැරි තරම් මහා විශාල එකක්. කොයි තරම්ද කියනවා නම් ඔය අශ්වාරෝහක පාසලෙන් උපාධි ගත්තු හැමෝගෙම ජීවිත එකතු කළත් මගේ වස්තුවට කිට්ටුවෙන් වත් තියන්න බැහැ." කරලීනා සුසුම් ලමින් කිව්වා. එවිටම අබිරහස් සිනාවත් ඇගේ මුහුණේ මතු වුණා.





"දැන් අපි කරන්න ඕන දේ අපි දන්නවා. ආයුබෝවන් කුරිරු කරලීනා." මෙහෙම කියාපු මුහුදු අශ්වයෝ දෙදෙනා එවෙලේම යුදබිමට පිටත්ව ගියා. ඔවුන් පළමු සටනේදී විස්මයජනක ධෛර්යයක් පෙන්වමින් සටන් කළා. දෙවැනි සටනේදී මරණයට පත් වුණා.

අනෙක් විවාහ අපේක්ෂකයන්ටත් කරලීනාගෙන් ලැබුණේ ඒ උත්තරයම තමයි.

බිචොක් මාළුවා ලියැන්ඩර් තමන්ගේ ජීවිතය සම්පූර්ණයෙන් විනාශ වූ බව කියමින් වැලපෙන්න පටන් ගත්තා. මුහුදු වෙරළට පැන සියදිවි නසා ගන්නා බවට දිවුරා පොරොන්දු වුණා. ඒත් ඔහු කිසිම දාක තමන්ගේ ඒ පොරොන්දුව ඉටු කළේ නම් නැහැ. ඒ වෙනුවට ඔහු කළේ කුරිරු කරලීනා වෙනුවෙන් අෂ්ට පද කවි ලියපු මුතුබෙලි කටු සියල්ලම කුඩු කර දමපු එක. ඊට පසුව ඔහු තීරු ලිපි ලියන්නෙක් හැටියට පුවත්පතකට සම්බන්ධ වෙලා





ඉහළ පෙළැන්තියේ සිරිත් විරිත්වලට විසකුරු පද්‍ය ලියමින් පහර ගහන්න පටන් ගත්තා. ඒ වගේම මුහුද යට දුම්රිය මාර්ග පද්ධතියේ වැඩකටයුතු උපහාසයට ලක් කරන්න පටන් ගත්තා. මේවායින් ඔහු විශාල කීර්තියක් වගේම විශාල ධනයක් උපයාගන්න සමත් වුණා.

ඊළඟට අපි අන්තෝනියෝ මඩු මාළුවා ගැන සොයා බැලුවොත්, ඔහු කළේ කරලීනාට බොහොම රළු විදිහට හිස නමල ආචාර කරල මෙහෙම කියාපු එක.

"මැතිනියනි, ඔබේ කැමැත්ත ඒක නම්, ඔබට මාව එපා නම්, ඒක එහෙම වුණාවෙ. හැබැයි හොඳට මතක තියාගන්න, මේ කරපු දේට මම ඔබට කවදාවත් සමාව නම් දෙන්නෙ නැහැ."

එහෙම කියාපු ඔහු තමන් ගෞරවනීය සභාපති ලෙස තනතුර දරාපු ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමයේ රැස්වීමකට යන්න ගියා.

කාලය ගතවෙලා ගියා. මේ වෙද්දී කරලීනාගේ මිතුරියන් හැමදෙනාම විවාහ වෙලත් බොහෝ කාලයක් ගතවෙලා ගිහින්. ඔවුන්ගෙන් වැඩි දෙනෙකුට මේ වෙද්දී දරුවන් පවා ලැබිලා. ඒත් කරලීනා තවමත් කුඩා ගැහැනු ළමයෙක් ලෙස හැසිරෙමින් මනාලයන් ප්‍රතික්ෂේප කරමින් සිටියා. කොහොම වුණත් ඇය තවමත් හරිම රූමත්. ඒ නිසා මනාලයන්ගෙන් නම් අඩුවක් ඇයට තිබුණේ නැහැ.

"රත්තරනේ, ඔයාට මොකද වෙලා තියන්නෙ?" බියපත් වුණු ඇගේ මිතුරියන් ඇහුවා.

"ඔයා කසාදයක් නොබැඳම අත්තම්මා කෙනෙක් වෙන්නයි යන්නෙ."

"නෑ. එහෙම වෙන්නෙ නැහැ. මට ගැළපෙන තරමේ කෙනෙක් හමු වුණාට පස්සේ මම කසාද බඳිනවා." කරලීනා ඔවුන්ට උත්තර දෙමින් කියා සිටියා.


"ඔව්. ඒත් කාලය ගත වෙනවා. ඔයා වයසට යනවා. ඒ වෙද්දී ප්‍රමාද වැඩි වෙලා තියෙන්න පුළුවන්."

දැන් ඇය ඇවිදින්නේ පැත්තකට ඇලවෙලා. ඇගේ වම් ඇලයට බරවෙලා. ඒ නම් කොහෙත්ම ලස්සන ගමනක් නෙවෙයි.

ටිකෙන් ටික කාලය ගතවෙද්දි ඇයගේ අත පතාගෙන එන අයත් අඩුවෙන්න පටන් ගත්තා. ඉඳහිට හෝ ආවේ ඩොෆිනොව්කා පළාතේ ජීවත් වෙන මුහුදු ජීවියෙක් විතරයි. ඒ පළාතට තවම ඇගේ මේ අරුම පුදුම හැසිරීම ඒ තරම් ආරංචි වෙලා නොතිබුණු නිසා.

කොහොම වුණත් ඇය දිගින් දිගටම බලාපොරොත්තුවක ඉන්නවා, දවසින් දවස තමන්ගේ පොහොසත් බව වැඩි වෙනවා නේදැයි සිතමින්. ඇගේ මුතුඇටය දැන් අලිගැට පේර ඇටයක් තරමට වැඩිලා තිබුණා. එය තව තවත් විශාල වෙන නිසා දැන්ම එය විකුණා දමන එක මොන මෝඩකමක්ද?






ඔන්න දැන් මේ කාලය වෙද්දී නම් කරලීනා තමන්ගේ පරණ මිතුරු මිතුරියන්ගේ සමාගමෙන් සම්පූර්ණයෙන්ම ඈත් වෙලා. එක්කෝ ඇය තනිවම ගෙදරට වෙලා ඇගේ මුතුඇටය දිහා බලමින් ඉන්නවා. එහෙමත් නැතිනම් ඇය මහලු ෆියනා සමඟ කාලය ගත කරන්නට යනවා. පෙඳ පාසි බැඳුණු බෙලිකටු ඇති මහලු බෙල්ලන් සහ මහලු කකුළුවන් වටකරගෙන ඇය ඉන්නවා. ඇත්තෙන්ම ඔවුන් සමඟ කාලය ගත කිරීම හරිම නීරස කම්මැළි හිතෙන දෙයක් වුණත්, ඇය, ඇයට හැකි තරම් නිහඬව කිසිම සෙලවීමක් නැතිව පරණ දිරා ගිය හිස් ටින් කැබැලි අතරේ ඉඳගෙන ඉන්න පුරුදු වුණා. මේ ටින් කැබැලි අවුරුදු ගණනකට කලින් ගොඩබිම සිට මුහුදට විසි කරපු ඒවා. මේ විදිහට ඉන්න විට කවුරුත්ම ඇයට බාල් නැටුම්වලට එන්න කියා බල කළේ නැහැ.

ඔය විදිහටම තවත් අවුරුදු කිහිපයක් ගත වෙලා ගියා. ඒත් තවමත් කරලීනාට තේරුම් ගිහින් තිබුණේ නැහැ තමන් මහලු කාන්තාවක් බවට පත්වෙලා තියෙන බව.

හැබැයි, මේ වෙද්දී ඇගේ මුතුඇටය ඇපල් ගෙඩියක් තරමට විශාල වෙලා. දැන් එය ඉතාම බරයි. මහලු රූමතියට දැන් එහා මෙහා පිහිනීමත් ඉතාම අපහසු දෙයක් බවට පත් වෙලා.

ඒත් අර සුපුරුදු අබිරහස් හිනාව ඇගේ මුහුණෙන් නැතිවෙලා ගියේ නම් නැහැ.


НОВОСТИ
ДНЯ

ඔන්න තවත් දවසක සුපුරුදු විදිහට ඈ තමන්ගේ නැන්දණියගේ ගෙදර ගිහින් ආපසු එන අතරතුර දී නගර චතුරස්‍රයේ සණට මුහුදු පැළෑටි හැදී තිබුණු සෙවණක තිබුණු බංකුවක හිඳ ගත්තා විවේක ගන්න. එවිටම එක්වරම පැමිණි දිලිසෙන මෝටර් රියක් නගරයේ ප්‍රසිද්ධම හෝටලය වුණු "මාස්කයා ස්වීස්දා" හෝටලයේ කිරිගරුඬ දොරටුව ඉදිරිපිට නැවැත්වූවා. බොහොම පියකරු පෙනුමක් ඇති තරුණ ඩොල්ෆින් කෙනෙක් ඒ මෝටර් රියෙන් එළියට බහිද්දී ඇගේ ඇස් දෙක අඳුරු වෙලා ගියා.

ඔහුගේ පුංචි තියුණු දත් දිලිසෙනවා හරියට පිරිසිදු සුදුම සුදු පාට මුතුඇට වගේ. කිසිම අඩුපාඩුවක් නැති තරුණ හිතුවක්කාර ඇස් දිලිසුණේ පුෂ්පරාග මැණික් දෙකක් වගේ. ඔහුගේ තද දිලිසෙන ඇඟ මුහුදු නිල් පැහැයේ සිට තද අළුපාට දක්වා නිල් පාටෙහි හැම ප්‍රභේදයකින්ම බැබළුණේ හරියට මාර්තු මාසයේ දවසක හිරු බැස ගිය පසුව ආද්‍රියාතික් මුහුද පෙනෙනවා වගේ. ඒ තරම් මෘදු ලස්සනකින්.

"ඔව්, ඒ එයා තමයි." කරලීනා කෑ ගසමින් තරුණ ඩොල්ෆින් පසු පස්සේ දුවල ගියා. ඔහු ඒ වෙද්දිත් හෝටලයට ඇතුළු වෙලා.

ඒත් දොරටුවේ මුරට සිටිය මහලු ඉකිරියා ඇගේ ගමනට හරස් වුණා.

"ඔබට මොනවාද ඕන කරන්නෙ. මැතිනියනි?"

"මට අර තරුණ ඩොල්ෆින්ව හමුවෙන්න ඕන." තමන්ගේ කලබලය අමාරුවෙන් පාලනය කරගත් සුල්තාන්කා කිව්වා.

"මම හිතන්නෙ නෑ කුමාරයාණන් ඔබව හමුවෙයි කියලා."

"කුමාරයාණන්?"


МОРСКАЯ ЗВЕЗДА

ඔව් මැතිනියනි, ඒ තමයි ආජියන්හි කුමාරයා. එයා මෙහාට ඇවිත් තියෙන්නෙ පැය කීපයක වැදගත් පෞද්ගලික කාරණාවකට. එයා ඇවිත් තියෙන්නෙ කසාද බඳින්න. මංගල උත්සවයෙන් පස්සේ එයා තමන්ගේ තරුණ බිරිඳ එක්ක ගම් රටවල් බලා පිටත්වෙලා යයි.

"හොඳයි. හොඳයි, අපි බලමුකෝ." කරලීනා එහෙම කියද්දී ඇගේ මුළු ඇඟම වෙව්ලන්න පටන් ගත්තා. "කාවද එයා කසාද බඳින්නෙ?"

"මැතිනියනි, ඔබතුමිය ඩොෆිනොව්කාවල කෙනෙක් වෙන්න ඕන. එහෙමත් නැතිනම් කාලයක් සමාජ ආශ්‍රයෙන් ඈත් වෙලා හිටියද? ඇයි දන්නෙ නැත්ද හැමෝම කතා වෙන දෙයක් නෙ, අබාසූර් මැතිනියගේ වැඩිමහලු දුව ක්‍රිසොලීටා මෙනෙවිය එක්ක



ආජියන් හි කුමාරයා විවාහ වෙන්න යන බව."

"ඒ කොහොමද එහෙම වෙන්නෙ?" කරලීනා කෑ ගැහුවේ තැති ගැනීමකින්. "එයා ක්‍රිසොලිටාව කසාද බඳින්න යනවා? අර ශීතල, කැත, ජෙලි මාළුවාව?"

"අන්න හරි මැතිනියනි."

"ඒක කොහොමටවත් වෙන්න බැහැ. මට හිතාගන්න බැහැ එයාගෙ මොන දෙයක්ද තියන්නෙ කුමාරයට කැමැති වෙන්න තරම්. ඇත්තටම, ඇත්තටම, එයාට කියල මොන දේ ද තියන්නෙ? කිසිම ලස්සනක් නෑ. හදවතක් නෑ, ජීවයක් නෑ. ඉර අව්ව වැටිල තියෙන වෙලාවක එයා දිහා බැලුවොත් පේනවනේ ඇතුළ සේරම හිස් කියල. හරියට හිස් ටින් එකක් වගේ."



"මැතිනියනි ඔබ තුමිය කියන දේ ඇත්ත තමයි. ආජියන්හි කුමාරයා තරුණ ලස්සන කෙනෙක් තමයි. ඒත් එයා මේ වෙද්දි සම්පූර්ණයෙන් නටබුන් වුණු කෙනෙක්. දැන් එයාට සිද්ධ වෙලා තියන්නෙ එයාගෙ ඉහළ පෙළැන්තියේ උප්පත්තිය නිසා කොහෙත්ම කැමැති නොවෙන දෙයක් වන රැකියාවකට යාම. එහෙම නැති නම් එයාට කරන්න වෙන්නෙ කැත, අප්‍රියජනක, පොහොසත් ජෙලි මාළුවෙක්ව කසාද බැඳලා සියක් දහසක මුදලක් දෑවැද්ද හැටියට ලබාගන්න."

"මොකක්? සියක් දහසක මුදලක් විතරයි ?"

"ඒක විශාල මුදලක් මැතිනියනි." මුහුදු ඉකිරියා බැරෑරුම් විදිහට කිව්වා. "විශේෂයෙන්ම අපේ කුමාරයාට කරන්න වෙනත් කිසිම දෙයක් ඉතිරි වෙලා නැති මේ වෙලාවෙ."

මේ දීර්ඝ විස්තර කිරීමට කන් දෙන්න කරලීනා තවත් එතැන රැඳිලා හිටියේ නැහැ. ඇය කටුවලින් පිරුණු ඉකිරියා පැත්තකට තල්ලු කරමින් ඉස්සරහට ගියා. ඔහුගේ කටුවලට ඇයව සීරුණත් ඇය එය ගණනකට ගත්තේ නැහැ.

මිනිසුන් හිතාගෙන ඉන්නේ මාළුන්ට තියන්නේ ශීතල ලේ කියල. ඒත් ඒ කතාව හැම වෙලාවකම ඇත්ත නෙවෙයි. කරලීනාගේ ලේ මේ වෙලාවේ නටන වතුර වගේ උණුසුම් වෙලා තිබුණා. කරලීනා අමුත්තන් පිළිගන්නා ශාලාවෙ එළිපත්ත ළඟට එද්දී ආජියන්හි කුමාරයා සුදුපාට අත්මේස් එකක් දමමින් හිටියා. මුල් වතාවේ දකිනවාටත් වඩා කරලීනා ඔහුගේ රූපයට වශී වුණා.

අවුලට පත්වෙලා සිටින බව පෙනුණු වයසක සුල්තාන්කා දකිද්දී තරුණ ඩොල්ෆින්ගේ පද්මරාග ඇස් පුදුමය නිසා දිලිසෙන්න පටන් ගත්තා. ඔහු කතා කරන්න හැදුවත් කරලීනා එයට ඉඩක් දුන්නෙ නැහැ.



"කුමාරයාණෙනි," ඇය කතාව පටන් ගත්තේ යාච්ඤා කරන්න පටන් ගන්නවා වගේ එක් වරලක් අහස දිහාවට ඔසවමින්. අනෙක් වරල මුතුඇටයේ බර නිසා පණ නැතිව ගිහින් තිබුණා. "මම ඔබ වෙනුවෙන් මගේ මුළු ජීවිත කාලයම බලාගෙන සිටියා. දැන් ඔබ ඇවිල්ලා. මම දන්නවා මම දන්නවා පිළිගත් සිරිත නෙවෙයි කියල තරුණ ගැහැනු ළමයෙක් මුල්ම පියවර තැබීම. ඒත් මම දැන් එහෙම කරනවා. මොකද ඔයා ලස්සන නිසා. මම ඔයාට ආදරය කරන නිසා."

"ඒත්, මැතිනියනි."

"එපා.. එපා.." කරලීනා සැරෙන් කිව්වා. "මම කියල ඉවරවෙනකම් ඔයා මොනවත් කියන්න එපා. මම හැමදේම දන්නවා. මම පොහොසත්, නිකම්ම පොහොසත් නෙවෙයි, විස්මයජනක විදිහට පොහොසත්. මම මේ මුළු ලෝකයටම වඩා වටිනා නිධානයක අයිතිකාරියක්. ඕනෑම ආභරණ වෙළෙන්දෙක් මගේ ඒ නිධානය අරගෙන මහා විශාල මුදලක් දෙනවාමයි. ඔයාට ඔය ලැබෙන්න යන දුප්පත් දැවැද්ද ඒකත් එක්ක බැලුවොත් හිස්ම හිස් දෙයක්. ඔයාට අර කිසිම ලස්සනක් නැති ළාබාල ක්‍රිසොලීටා පුංචි තිතක් වගේ පේන්න  ගනියි. මම ඒ නිධානය ඔයාගේ දෙපා මුල තියනවා. එතකොට ඔයා මේ මුළු විශ්වයේම ඉන්න පොහොසත්ම, ප්‍රීතිමත්ම මුහුදු ජීවියා බවට පත් වෙනවා."

"දැන් ඉතින් කියන්න තියෙන දේ කියන්න."

"හ්ම්." සැබෑම කෙරාටිකයෙක් වුණු තරුණ ඩොල්ෆින් කිව්වා. ඔහුගේ පද්මරාග ඇස්දෙක කෑදර කමින් දිලිසුණා. එත් මට ඒ නිධානය මුලින් බලන්න ඕන."

"ඒක ඔබ ඉස්සරහම තියෙනවා කුමාරයාණෙනි." එහෙම කියපු කරලීනා ආජියන්හි කුමාරයාට මුතුඇටය පෙන්වීමට ඇය ඇගේ උතුරු සළුව ඉවතට ගත්තා. මුතුඇටය තරමක් විශාල වුණු දවස්වල ඉඳලාම ඇය මේ උතුරු සළුව පාවිච්චි කළේ මුතුඇටය අනික් අයට පෙනෙන නිසා.

ඒත් ඩොල්ෆින් ඇය බලාපොරොත්තු වුණු විදිහට පුදුමයට පත් වුණේ නැහැ. ඊට පසුව ඔහු කිසිම උනන්දුවක් නැති විදිහට මෙහෙම කිව්වා.

"මැතිනියනි, ඔබ දන්නවා ඇති නොවැ මම මුතුඇට වගේ දේවල් ගැන විශේෂඥයෙක් නොවන බව. මම වඩා කැමැතියි මට හුරු පුරුදු දෙයක් තියෙනවා නම්. ඒ කියන්නේ සල්ලි වගේ දෙයක්."

"ඕ.. හෝ.. ඒක මොනතරම් ලේසි ඉල්ලීමක්ද? කරලීනා සතුටින් කෑ ගැහුවා. මම දැන්ම ආභරණ වෙළෙන්දා හමු වෙන්න ගිහින් ඔයාට සල්ලි කුඩයක් අරන් එන්නම්. කුඩ තුනක්ම. ඔයාට කීයක් ඕනද? "





"මට හිතන්නේ මට කුඩා හතරක් තිබුණ නම් ඇති." තරුණ ඩොල්ෆින් කිව්වා. "ඒත් මට වැඩි වෙලාවක් ඉන්න ලැබෙයිද කියන්න බැහැ. මොකද මම තව පැයකින් දේවස්ථානයේ ඉන්න ඕන."

"මම හරියටම තව පැයක් යද්දි මෙතනට එනවා."

"බොහොම හොඳයි." ඩොල්ෆින් කිව්වේ සාක්කුවෙන් රත්තරන් ඔරලෝසුවක් එළියට ගනිමින්. "දැන් වෙලාව තුනට කාලයි. ඔයා හතරට කාලක් වෙද්දී මෙතනට ආපහු නාවොත් මට දුකෙන් අකැමැත්තෙන් වුණත් දේවස්ථානයට යන්න වෙනවා විවාහ වෙන්න."

ඔබට හිතාගන්න පුළුවන් නොවැ ප්‍රේමය උතුරායන කරලීනා ආභරණ වෙළෙන්දා ළඟට ගිය හැටි.

එහෙම යන අතරතුරදී පෙරළුණා, වැටෙන්න ගියා. ඔන්න ඔහොම කලබලයෙන් ආපු ඇය ගිමන් හරින්න ඉඳගත්තේ ආභරණ වෙළෙන්දා ළඟටම ඇවිත් තමයි. ඇගේ මහලු හදවත ඇගේ මහලු පපුව ඇතුළේ මහ හයියෙන් ගැහෙනවා. ඇය බොහොම අමාරුවෙන් තමයි හුස්ම ඉහළ පහළ හෙළුවේ. හරියට ඇයව වතුරෙන් එළියට අරගෙන මුහුදු වෙරළට විසි කරලා වගෙයි. ඒ වුණත් ඇයට නම් දැනුණේ ඇය අත්තටු ලැබිලා පියාඹනවා වගෙයි.





"මම ඔබට ගෙනල්ලා තියෙනවා මේ ලෝකේ දුර්ලභම දෙය." ආභරණ වෙළෙන්දාගේ මේසය දිහාට යන ගමන් ඇය කිව්වා. "ඒක ඔබගේ ළඟ ඇති මුදල් සේරටම වඩා වටිනා දෙයක්. ඒත් මට ඒ තරම් ඕන නෑ. කුඩ හතරක් පුරවල සල්ලි තිබුණා නම් හොඳටම ඇති. ඔබට පුළුවන් ඉතිරිය තියා ගන්න. ඒක කොයි තරම් ලොකු මුදලක් වුණත් කමක් නැහැ. දෙවියන්ගේ නාමෙන්, මට ඉක්මන් කළා නම් ඒ ඇති."

ආභරණ වෙළෙන්දා මේවා කිසිම දෙයක් දැකලා කලබල නොවන අත්දැකීම් බහුල මහලු කකුළුවෙක්. තමන්ගේ ඇසට කුඩා දේ විශාල කරල බලන කණ්ණාඩියක් සවිකරන ගමන් ඔහු මෙහෙම කිව්වා.

"ඉඳගන්න මැතිනියනි, සත්තකින්ම අපි කුඩා හතරක් පුරවල මුදල් හැම වෙලාවකම තියාගෙන ඉන්නෙ. ඒත් අපි මුදල් ගැන කතා කරන්න කලින් ඔබ විකුණන්න ගෙනාපු දේ පරීක්ෂා කරල ඉදිමු."


ඔන්න එතකොට කරලීනා ඇගේ මුතුඇටය ඔහුට පෙන්නුවා.

මහලු කකුළුවා බොහෝ වෙලාවක් යනකම් ඔහු ඇස් කණ්ණාඩිය ගලවමින් නැවත දමාගනිමින් හැම පැත්තකින්ම එය දිහා බැලුවා. අන්තිමේදී ඔහු තමන්ගේ පරීක්ෂා කිරීම අවසන් කරලා මෙහෙම කිව්වා.

"ඔබ නිවැරැදියි මැතිනියනි. මේක ඉතාම ඉතාම දුර්ලභයි. ඒත් ඔබ කලබලේට ඇවිත් තියෙන්නේ වැරැදි තැනකට. ඔබට යන්න වෙන්නේ එක්කෝ කෞතුකාගාරයකට එහෙම නැතිනම් අරුම පුදුම දේ ප්‍රදර්ශනය කරන ප්‍රදර්ශනාගාරයකට. කනගාටුයි මැතිනියනි අපේ සමාගම 'ඉන්නන්' මිලදී ගන්නේ නැහැ."

"එහෙම වෙන්න බැහැ." කරලීනා කෑ ගැහුවා. ඇයට සිහිය නැති නොවුණා විතරයි. "මේක මැණිකක්. ඔබට පේන්නේ නැත්ද? මේක ලෝකෙ ලොකුම මුතුඇටය."

"නෑ මැතිනියනි, ඔබට වැරදීමක් වෙලා. මේ ඉන්නෙක්. අවාසනාවකට වුණත් මම ඒ ගැන හොඳටම දන්නවා. මගේ මැරුණු බිරිඳගේ දකුණු අත් හැන්දේ මේ වගේම ඉන්නෙක් හැදිලා තිබුණා. එකම වෙනස ඒක මේ තරම් ලොකු නැහැ. ඒක හැදෙන්න හේතුව තමයි වැලි ඇටයක් අත් හැන්දේ හිර වීම. එයා ඒ ගැන වැඩියෙ තැකීමක් නොකර ඉඳපු නිසා ඒක දිගටම වැඩිලා විශාල වුණා. එයාට ඕක නොහැදුණා නම් එයා පොකිරිස්සන් අල්ලන ළමයෙකුගේ දැලක පැටලෙන්නේ නැහැ. ඒක එහෙම නොවුණත් මැතිනියනි ඔබ දැනගෙන ඉන්නම ඕන නොවැ 'මුතුඇට' උපදින්නේ මුතු බෙල්ලන් ඇතුළේ බව. මැතිනියනි ඔබ වගේ ලස්සන මාළුවකුගේ වරලක..."



"ඒත්... ඒත්... මගේ නැන්දා එයාගෙම ඇස් දෙකෙන් පරණ මායා පොතකින් කියවලා කිව්වේ?" කරලීනා වේදනාව, ඊර්ෂ්‍යාව බලාපොරොත්තු සුන්වීම නිසා තුවාල වුණු හදවතින්, වෙව්ලන කට හඬකින් කියන්න පටන් ගත්තා.

"මැතිනියනි. කිසිම කෙනෙක් පරණ අත් ඇරල දාපු මායා පොත් විශ්වාස කරන්න හොඳ නැහැ. ඔය වගේ ඉපැරැණි මායා පොත්වල තියෙන හැම දේම ඇත්ත නම් අපේ ජීවිත හරිම ලස්සන සතුටෙන් පිරිල ඉතිරිලා තියෙන්න ඕන. ඒ වුණත්.. ඔබ අඬනවා ද?"




කඩවසම් ඩොල්ෆින් තමන්ගේ තරුණ බිරිඳ මෙඩූසා ක්‍රිසොලීටා එක්ක දෙවස්ථානයෙන් එළියට එද්දී කරලීනා අනෙක් සිඟාකන මාළුන් සමඟ පෝටිකෝවේ සිටගෙන හිටියා. මහලුව කුදු ගැසී සිටි ඇගේ, කාලයකට කලින් ඉතාම ලස්සනට තිබුණු ඇස් දෙක කඳුළින් පිරිලා තිබුණා.

ක්‍රිසොලීටා ඇයව හඳුනාගෙන ආජියන්හි කුමාරයාට මෙහෙම කිව්වා.

"කුමාරයාණෙනි, මේ බලන්න පොඩිත්තකට අර දුප්පත් ගැහැනු කෙනා දිහා. එයා ඒ කාලේ හරිම ලස්සනයි. අපි ගියේ එකම ඉස්කෝලෙට. එයා ඒ කාලෙ කා අතරෙත් හරිම ජනප්‍රිය කෙනෙක්."











"හත් පෙති මල සහ තවත් කතා"
එකතුවට උපදේශාත්මක සුරංගනා කතා
5 ක් ඇතුළත් වේ. "හත් පෙති මල" යනු වලෙන්තීන්
කතායෙව්ගේ ප්‍රසිද්ධතම නිර්මාණය වන අතර දරුවන්ට
අනුකම්පාව, කරුණාව සහ අන්‍යෝන්‍ය සහයෝගය උගන්වයි.
ජීවමාන ආදර්ශයක් තුළින් වඩා වැදගත් සදාචාරාත්මක සාරධර්ම
තේරුම් ගැනීමට උපකාරී වේ. එය පවසන්නේ ඔබට නොසැලකිලිමත් ලෙස
අවස්ථාවන් ඉවත දැමිය නොහැකි බවත්, ඔබ ප්‍රතිචාර දැක්විය යුතු බවත්
දුර්වලයන්ට උපකාර කළ යුතු බවත් ය. "නළාව සහ ජෝගුව" යන සුරංගනා
කතාව ඔබට කම්මැලි නොවීමට උගන්වයි. කිසිවක් පහසුවෙන් නොලැබෙන බව
එය කියා දෙයි. "ලී කොටය" සුරංගනා කතාවෙන් කියා දෙන්නේ ගවේෂණයන්
ගෙන් තොර විශ්වාසයන් තමා විසින් තමාවම නින්දාවට පත් කර ගන්නා බවයි.
"බිම් මල්" සුරංගනා කතාව අධි තක්සේරුවෙන් සිටීම අසාර්ථකත්වයට මුල
බව කියා දෙයි "මුතු ඇටය" නම් සුරංගනා කතාව උගන්වන්නේ උඩඟු
නොවී සිටීමටත්, මිතුරන්ගෙන් ඈත් නොවීමටත්, තහවුරු නොකළ
තොරතුරු විශ්වාස නොකිරීමටත් ය.






පොතක්.LK

facebook.com/pothak.lk
072 636 6000
www.pothak.lk
Pothak.lk (Pvt) Ltd.
Ganemulla Road, Kadawatha.

Visit our website to get exclusive discounts on your next order

ISBN 978-624-6327-15-6
9786246327156
Rs. 2000/=